# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2467/39 – 2025 දෙසැම්බර් මස 16 වැනි අඟහරුවාදා – 2025.12.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත**
**හිඟුරක්ගොඩ සංවර්ධන ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් රත්නායක වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2025 ජුනි 05 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත හිඟුරක්ගොඩ සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

**බිමල් රත්නායක (පා.ම),**
**ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.**

2025 නොවැම්බර් මස 24 වැනි දින,
ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - 11
බත්තරමුල්ල.

EOG 12 - 0149/1


1A – PG 7410 – 18 (2025/12)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත
හිඟුරක්ගොඩ සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත හිඟුරක්ගොඩ සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 2025 ක් වූ නොවැම්බර් මස 24 වන දින, ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් රත්නායක වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**බිමල් රත්නායක (පා.ම),**
ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 10 වැනි දින,
ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - 11
බත්තරමුල්ල.

EOG 12 - 0149/2

---

**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත
හිඟුරක්ගොඩ සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත හිඟුරක්ගොඩ සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් රත්නායක මැතිතුමා විසින්, එකී පනතේ 8 ( ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 නොවැම්බර් මස 24 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**කපිල සී. කේ. පෙරේරා,**
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය.

2025 දෙසැම්බර් මස 10 වැනි දින,

EOG 12 - 0149/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.